
Page 8 October 2009 .qxd 05/10/2009 13:49 Page 1



## කවි කොළය



# එම්බා දෙපය !

දණගා ගියත් මොළකැටි අවදියෙදි එදා
උඹ මා රැගෙන යයි දැන් මා බිමට නොදා
ලැබුවේ නිදහසක් ගත් මොහොතකය නිදා
එම්බා දෙපය! වහලෙකු වී සිටින සදා

පෙර දුටු සැනින් වැඩුවද සිත තුළ ආසා
හොරි දද හැදි වණ වී අඟලක් පාසා
වයසට යද්දි ඇති කොට කරදර මේසා
ඉල්ලනවාද නුඹ වෙන රටකට වීසා

ඇරඹූ ගමන හැත්තෑ දෙවසකට පෙර
සැතපුම් ගෙවා විසි දාහක් තරම දුර
උසුලා කිලෝ හැට හතරක සිරුරෙ බර
උඹ අද සිටී ගවයෙකු මෙන් ගෙවුණු කුර

ඉදිමී දෙදණ වැතිරී ලෙඩ ඇඳක දපා
මා පසුවෙද්දි වැටෙමින් දුක් ගොඩක අපා
දොස්තර හදයි වෙන් කෙරුමට උඹව කපා
මට උඹ නැතුව නම් මේ ජිවිතය එපා

මිනිහා දෙපා ලද්දෙකි යයි කියති ගරු
උඹ කෙරුවෙහිය ඒ බසද සදහටම බොරු
අමතර පා දෙකක් දී මට කිහිලි කරු
සිව්පාවෙකු කළා උඹ මා නොසිතු විරු

විටෙකදි සිතට මතුවෙයි උඹ ගැනද සිනා
කිසිවෙකු විටෙක ආ විට අවි මුගුරු වනා
මා රැක ගැනීමට සිහියෙන් යුතුව මනා
උඹ එක පයින් ජූඩෝ කාරයෙකු වුණා

දූවිලි, මඩවගුරු, කැත කුණු හැම දේම
ඉවසා දරා මා වෙනුවෙන් එක සේම
වෙව්ලන නමුත් වයසට ගොස් උඹ තාම
නැත නැවතුවේ මා උසුලාගෙන යෑම

කඳුහෙල් අතර මං පෙත් ගත නොහැකි සොයා
මහ කටුගාල් බිඳගෙන වීරයෙකු නියා
වාහන නොයන තැන්වල මා රැගෙන ගියා
නමදිමි උඹව මම උඹ දෙවියෙකිය කියා

උහුලා මගේ බර
ඉපදුණු දා සිටම
මා හැර නොගොස්
පණමෙන් සිටි හැම විටම
දුක හිතෙනවා උඹ ගැන
ඇත්තට මටම
මම මේ බරින් මුදවමි
උඹ අද හෙටම



♦ තලන්ගම ජයසිංහ
Sri Lanka


හෙළ දරු වරුණ

හෙළ දරුවන්ගේ සංස්කෘතික කලා මංගල්‍යය

2009 ඔක්තෝබර් 17 වනදා සවස 5-10 දක්වා

බටහිර ලන්ඩනයේ හවුන්ස්ලෝ පෙදෙසේ

Lampton School (TW3 4EP) හි දී

ඇතුළු වීම - ඇරයුම් ලබන්නන්ට පමණයි.

ඔබේ ආරාධනා පත වෙන් කරවා ගැනීමට සහ

වැඩි විස්තර සඳහා අමතන්න →

ආසිරි බණ්ඩාර 07894791159 - 07809730453


## කර්තෘට ලියුම්
## Letters to the Editor

### භාෂා 5 ක් කතාකරන සිංහළ දරුවෝ

ලංකාවිත්ති පුවත්පතේ කතුතුමා වෙතටයි.

අප ඔබට බොහෝ ස්තුති වන්තවෙනවා ඉමහත් අසීරු තා මැද මෙවැනි අගනා පුවත් පතක් එළිදැක්වීම ගැන. එසේම මේ කරුණ ගැනද මා ඔබට කිව යුතුයි.

අපගේ දරුවන් දෙදෙනා මේ රටේ ඉපදුනත් මව් පියන් වශයෙන් අපි හරිම ආඩම්බර වෙනවා, ඒ දෙදෙනාටම අපේ මව්බස ඉතාම හොඳින් කතාකරන්නට ඉගැනවීම ගැන. ඒ වගේම අප මෙම පුවත්පතින් එයාලාට අපගේ සිංහළ බස කියවීමට හා ලිවීමට පුරුදු පුහුණු කරනවා.

අපගේ දරුවන් දෙදෙනාම දැනට මෙහි පෞද්ගලික පාසැල් දෙකක ඉගෙනුම ලබන අතර ඒ අයගේ ගුරුවරුන් පිළිගෙන තිබෙනවා මේ දරුවන් තම මව් භාෂාව හොඳින් ඉගෙන ගෙන තිබීම වෙනත් භාෂාවන් ඉගෙනීම සඳහා විශාල ප්‍රයෝජනයක් වී ඇති බව.

මගේ දුවට භාෂා 5 ක් කතා කිරීමට හා ලිවීමට පුළුවන්. දුවට වයස 16 යි. පුතාට වයස 13 යි. එයාට පුළුවනි භාෂා 4 ක්. තම මව්බස හා වෙනත් බසක් කතාකිරීමට හැකියාව ඇති ළමයින්ගේ මොළයේ වර්ධනය ඉතා ශීඝ්‍රයෙන් සිදුවන බව දැන් සොයා ගෙන තිබෙනවා.

ලංකාවිත්ති පුවත් පතෙන් මා ඉල්ලා සිටින්නේ මෙයයි. මේ රටේ හා වෙනත් විදේශ රටවල සිටින මෝඩ සිංහළ දෙමාපියන්ට කියලා දෙන්න මව්බස වන සිංහළ ප්‍රථම යෙන් දරුවාට උගන්වන්න කියා. බොරු ශෝහනේට, කිසි සත්‍යතාවක් නැති, කළු සුද්න්ගේ බස් වලට රැවටී, සිංහළ අමතක නොකර, එය තමන්ගේ දරුවන්ට ප්‍රගුණ කරවන්නට කියන්න.

අපේ සිංහළයා විතරයි කියන්නේ ළමයින්ට සිංහළ උගන්වන්න ගියොත් ඒ ළමයින්ගේ ඔළුව ඇතුළේ ලොකු අවුලක්වෙලා ඒ ළමයින්ට හැමදේම පටලැවෙන බව. අනෙක් සියළුම විජාතික යන්ගේ දරුවන් ඉංග්‍රීසි ඉගෙන ගන්නා අතරේ කිසි අවුලක් නැතුව ඒ අයගේ ආවේණික භාෂාවනුත් චතුර ලෙස කතා කරන්නේ එහෙනම් කොහොමද?

ලංකා විත්ති පත්‍රය ඉදිරියට ගෙනයාමට වැඩි වැඩියෙන් ඔබට ශක්තිය හා ධෛර්‍යය ලැබේවායි පතමි.

ලලන්ති ජයවර්ධන
Ewell, Surrey UK

## * හෙළ දරු වරුණ *

එංගලන්තයේ උපන් සිංහල දරු දැරියන් විසින් ඉදිරිපත් කරන ලද සිංහළ සංස්කෘතික කලා මංගල්‍යයක් ප්‍රථම වරට **2007** දෙසැම්බර් මස **8** වෙනි දින බටහිර ලන්ඩනයේ වේදිකාවක එළිදැක්වූ අතර, එය නමින් **හෙළ දරු වරුණ** නම් වීය.

එදින එම සංස්කෘතික කළා මංගල්‍යය නැරඹීම පිණිස පැමිණි සියළු දෙනාගේ නෙතගට කඳුලක් නැගුනේ අපේ ඒ ආදරණීය කුඩා දූ පුතුන් හෙළ සංස්කෘතියේ විවිධාංග කිසිම වැඩිහිටියෙකුගේ මග පෙන්වීමකින් තොරව වේදිකාව මත ප්‍රදර්ශනය කළ අපූරුවත්, නොරටක උපන්නත් ඒ දරුවන්ගේ සිරුරේ සිංහළ සංස්කෘතික ගති ආර සහජයෙන්ම පිහිටා ඇති බව එදා මනාව ප්‍රත්‍යක්ෂ වූ නිසාත් ය.

සාමාන්‍යයෙන් බටහිර සංස්කෘතිය ඇසුරු කරන අප දරුවන් එම සංස්කෘතිය අනුගමනය කිරීම වලක්වාලිය නොහැකි වන අතර බටහිර සංස්කෘතිය සහ අපේ හෙළ සංස්කෘතිය පරස්පර විරෝධී බව ද අප දනිමු. එහෙත් එවන් පරිසරයක් තුළ සිදුකළ මෙම උඩු ගං බලා පිහිණීමේ කාර්‍යයේ වැදගත්කම මෙරට වසන හෙළසිරිත් අගයන කාගේත් සිත් සතන් තුළ ට මේ වන විට කිඳා බැස හමාර ය.

හෙළ දරු වරුණ යනු එංගලන්තයේ වෙසෙන ශ්‍රී ලාංකික දරු දැරියන්ගේ හෙළ කලා කුසලතාවන් එකම වේදිකාවකදී එළි දක්වන සංස්කෘතික මංගල්‍යයකි. මෙහි විශේෂතා බොහොමයක් ඇත. ඉන් කිහිපයක් නම්:

ප්‍රසංගය ආරම්භයේ සිට අවසානය දක්වාම එය මෙහෙයවනු ලබන්නේත් එහි නිවේදන කටයුතු සියල්ල පවා සිදුකරනු ලබන්නේත් ඒ දරුවන් විසින් ම ය.

හෙළ සංස්කෘතියේ විවිධ පැතිකඩ මෙහි දී ඔවුන් ඉදිරිපත් කරන අතර, ජන ගී, ජන නැටුම් ගී ගැයුම්, උඩරට හා පහතරට නර්තනාංග, විරිදු හා නාට්‍ය ජවනිකා ඇතුළු අංග ගණනාවකින් ප්‍රසංගය විචිත්‍රවත් කෙරේ.

එංගලන්තයේ විවිධ ප්‍රදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකීය දරුවන් සියයකට ආසන්න ප්‍රමාණයක් එකම වේදිකාවක, එකට මුණ ගැසෙන, එකම අවස්ථාව මෙයවන අතර, මේවන විට ඔව්හු එකිනෙකා දැන හඳුනා ගෙන සහෝදරත්වයෙන් වෙළී සිටිති.

මෙය විශේෂයෙන් බටහිර සංස්කෘතිය මතින් ශ්‍රී ලාංකීය අනන්‍යතාව ඉදිරියට රැගෙන යාමට තැනූ පාලමේ මූලික පදනම ලෙස සැලකිය හැකි ය.

හෙළ දරු වරුණ ප්‍රසංගයට සහභාගි වන සියළුම දරුවන් සිංහල ජාතික ඇඳුමින් සැරසී සිටින අතර ප්‍රසංගය නැරඹීමට පැමිණෙන අයටද හැකි පමණින් ජාතික ඇඳුමින් හැරසී එන ලෙස ඔව්හු ආයා චනය කරති.

♦ ආසිරි බණ්ඩාර

**සැ**බෑ ශ්‍රී ලාංකීය ගැමි සුවඳ හිරු නොබසිනා අධිරාජ්‍යයේ වේදිකාවක් මතදී අපේම දරුවන් වෙතින් ඔබට දැක බලා ගැනීමට ලැබෙන මෙම විරල අවස්ථාවට එක්වන ලෙසට ඔබ සැමට ආරාධනා කරමු. කරුණා කර ඔබට හැකි පමණින් සිංහල ජාතික ඇඳුමින් සැරසී පැමිණ හෙළ දරු වැරුණ ප්‍රසංගය වර්ණවත් කිරීමට ඔබ ද දායක වන්න

ප්‍රසංගය නැරඹීම සඳහා ඕනෑම කෙනෙකුට සහභාගි විය හැකි අතර ඒ සඳහා ආරාධනා පතක් ලබා ගත යුතුය. ප්‍රධාන සංවිධායක **ආසිරි බණ්ඩාර - 07894791159 - 07809730453** හෝ සංවිධායක කමිටුවේ **ස්වර්ණා විරසිංහ - 0207 2720963 - 07737151127** හෝ **විජේ රත්න බණ්ඩාර - 0208 5773571 - 07967815365** ඇමතීමෙන් ප්‍රසංගය සම්බන්ධ වැඩි විස්තර සහ ආරාධනා පත් ලබා ගත හැක.



**ඉරිදා - SUN** මේ දවස් වල ගාල්ලෙ පළාත් පාලන ඡන්දෙ නිසා ගාල්ලට සම්බන්ධ හුඟ දෙනෙක් විපරමෙන් ඉන්නෙ. ඇල්පර්ටන්වල රන්ජනීලගෙ මස්සිනා කෙනෙකුත් ගාල්ලෙ ඡන්දෙ ඉල්ලනවා. පෙරේදා කවුද කස්ටියක් මස්සිනාට හොඳටම ගහලා. කාර් එකේ වීදුරුත් කඩලා. මූණ අත පය සේරම වෙළුම් පටිවලින් ඔතාගෙනලු මැන් දැන් ඉන්නෙ. හැමෝම මස්සිනාට කිව්වලු ඉල්ලන්න එපැයි කියලා. ඒත් පණ්ඩිතකමට ඉල්ලනවයි කියලා රන්ජනී බනිනවා. රන්ජනීගෙ වැඩේම දවසට දහ දොළොස් වතාවක් ගාල්ලට කතාකරලා මස්සිනාගෙ දුක් සැප අහනවා. කාලයක් ලංකාවෙ මිනිස්සු යුද්දෙට ගිය පවුලෙ ඇයො ගැන බයෙන් හිටියා. කීමට නං කියන්නෙ මූදු යන එකයි, අතුරෙ රාමදින්න යන එකයි තමාය භයානකම රස්සාවල් කියලා. දැන් බලාගෙන යන කොට ඡන්දෙ ඉල්ලන එක ඊට වඩා භයානකයි.

**සඳුදා - MON** මේකත් ගාල්ලෙ ඡන්දෙට සබන්ධයි. මට නම නම් හරියට මතක නැහැ, එක අපේක්ෂකයෙක් ඡන්ද වේදිකාවෙ කිව්වලු මට අත්දෙකෙන්ම වෙඩිතියන්න පුළුවන්, ඒක හන්දා මාව දිනවන්න කියලා. දැන් අන්න මැන්ට වෙන වරදකට නඩු දාලා. අත්දෙකෙන් වෙඩි තියන්න ඇහැකි නම් ඉතින් එයා හමුදාවට නේ බැඳෙන්න ඕන. අර ත්‍රස්තවාදියො හිටපු දිහාවට නේ යන්න තිබුණෙ. ගමේ ඉඳලා කාට වෙඩි තියන්නද? භාවන්ට තලගොයින්ටද? ඔයවගේ පාන් බට්ටන්ට මිනිස්සු ඡන්දෙත් දෙනවද? ගාල්ල ඔච්චර පිරිහිලා කියලා මං නං හිතුවෙ නැහැ.

**කුජදා - TUE** මේ ඇමරිකාවෙ අළුත්ම කේස් එක. අර මහ මූසල මූණක් තියෙන ක්ලිංටන් ගෑණුකෙනා අමූලික බොරු චෝදනාවක් ගෙනැල්ලා, ලංකාවෙ හමුදාවෙ අය යුද්දෙදි උතුරෙ දාස් ගණනක් දෙමළ ගෑනුන්ව දූෂණය කරලා තියනවයි කියලා. එයා හදන්නෙ අපිව යුද්ධ අධිකරණෙට ගෙනියන්න. ඒ දූෂණ කතාව බොරු විතරක් නෙවෙයි, ඒ ගෑනිට කොහොමටවත් එහෙම කතාවක් කියන්න අයිතියක් නෑ. එයාගෙ මිනිහා ජනාධිපති කාලෙ ඒ කාර්‍යාලෙ ඇතුළෙම අර මොනිකා ලුවින්ස්කි කියන කෙල්ලට ඒ මිනිහා කරපු නොසංඩාල වැඩ මුළුලෝකෙම දන්නවා. ඇයි අපේ අය ඕකිට ඒක ආයි මතක් කරලා දීලා ළඟට ගිහිං මූණට දමලා අනින්නෙ නැත්තෙ ?

**බුදදා- WED** අපේ රටේ කෙරෙන දේවල් ගැන මම අහපුවා විහිළු තහළු පොත් දාස්ගණනක් ලියන්න තරම් ඇති. මේ පෙරේදා සීදුවෙ කැතරින් නැන්දා කියපු කතාවක්. නැන්දගෙ නෑකෙනෙකුගෙ මරණයක් වෙලා. ඉතිං ඒකට මරණ දැන්වීමක් හා ශෝක ප්‍රකාශයක් අච්චු ගහන්න ගියාම ඒ අච්චු කන්තෝරුව මිනිහා ඇහුවලු කෝ මැරුණු එක්කෙනාගෙ පොටෝ එකක් ගෙනාවෙ නැද්ද කියලා. අනේ පොටෝඑකක් ගෙදර හැමතැනම හෙව්වා, හොයාගන්න බැරිවුනා, ඔය ඔහේලා ළඟ තියන කාගෙ හරි කමක් නෑ පිරිමි කෙනෙකුගෙ පිටිපස්ස හරවගෙන ඉන්න පොටෝඑකක් දාලා, මේක අච්චුගහලා ඉක්මනට දෙන්න කිව්වලු. ඒපාර එහෙම කරලා. පිටිපස්ස හැරිලා ඉන්නකොට මිනිහ අඳුරන්න බැනේ. මැරිච්ච කෙනා නෙවෙයි කියන්නත් බැනේ. ඒකයි. ඔන්න ලංකාවෙ වැඩ.

**ගුරුදා - THU** ශ්‍රීලංකා නිදහස් පක්ෂයේ නිර්මාතෘ බණ්ඩාරනායක මහත්තෙයා. එතුමා දිංවංගතවෙලා ගිය සැප්තැම්බර් 26 වෙනිදට අවුරුදු 50 ක් පිරුණා. හැම අවුරුද්දෙම කෙරෙන විදියට එතුමාගේ ගුණ සැමරීම හොරගොල්ලේ සමාධිය ළඟ මේ පාර තිබුණට ඒ පක්ෂයේ සභාපතිවත්, ලේකම්වත් ඒකට ගිහින් නෑ. ඒ පක්ෂය නොතිබෙන්න ඒගොල්ලොත් නෑ. ඔන්න පක්ෂයෙ අයම බණ්ඩාරනායක මහත්තෙයට කෙළෙහි ගුණ සලකපු හැටි කියලා කලගෙඩිහේනේ පුංචි අම්ම ලියලා එවලා තිබුණා. පුංචිඅම්මයි. බාප්පයි දෙන්න ඒ අනුස්මරණයට ගිහිං ඇවිත් තමයි ඒලියුම ලියලා තියෙන්නෙ. අපේ වෙද මුත්තා නිතර කියන කතාවක් මතක් වෙනවා. මුත්තා කියනවා, “සිංහළ මිනිස්සු ළඟ කොයින්ද බං කෙළෙහි ගුණ...? කෙළෙහි ගුණ තියෙන්නෙ බං පඩික්කමේ.....” කියලා. ඒ කතාව සම්පූර්ණ ඇත්ත.

**කිවිදා - FRI** උතුරු නැගණහිර සරණාගත කඳවුරුවලින් දෙමළ ජනයා විසිදාහක් පැනලා ගිහිං කියලා ලංකාවෙ පත්තරවල තිබුණා. ආයි මදුරුවෙකුටවත් පිටවෙන්න බැරි විදියට තදින්ම ආරක්ෂාව දාලා තිබුණයි කිව්වට ඒ සේරම කියුම් බොරු බව දැන් තේරෙනවා. ඒ සිකියුරිටි බාරව ඉන්න ඇයින්ගෙන් ඇහුවම “මෙච්චර ගණනක් පැනලා යනකල් මොනවද කළේ” කියලා, “අපි මුකුත් කළේ නෑ” කිව්වලු. “තමුසෙලා මුකුත් කළේ නැති හින්ද තමයි ඕයි මුන් පැනලා ගියේ” කිව්වම “හරි හරි අපි මීට පස්සෙ කිසි කෙනෙකුට පැනල යන්න දෙන්නෙ නෑ ... ඔය ගිය ඇයො ටික දවසකින් එළියෙ කන්න නැති වෙනකොට ආපහු එන්නත් පුළුවන්” කියලා දත් ටික විරිත්තලා හිනාවුනාලු. එතන තව ලොක්කෙක් කිව්වලු “මේ කඳවුරුවල පෙරේත දෝසයක් තියන නිසයි මේ සේරම ඇබැද්දි, ඒ දෝස මකන්න ළඟදිම කට්ටඩි කීප දෙනෙක් ගෙනැල්ලා වැඩක් කරන්න යනව” යි කියලා.